# කොවිඩ් 19 සති පාසල සබරගමු පළාත.
## නිවිතිගල අධ්‍යාපන කලාපය.
## භූගෝල විද්‍යාව - 9 ශ්‍රේණිය -2021- දෙවන වාරය.
### අටවන සතිය (ජුනි 20 සිට ජුනි 26 දක්වා)

**ශ්‍රී ලංකාවේ භෞතික භූ දර්ශනය**
**ඒකක අවසාන පරීක්ෂණය**

- දෙවන ඒකකයට අදාළ විෂය කරුණු යළි සිහියට නගා ගනිමින් පහත ක්‍රියාකාරකම්වල යෙදෙන්න.

**ක්‍රියාකාරකම 01**
සුදුසු වචන වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

1. මුහුදු මට්ටමේ සිට මීටර් 50 ක් උස සමෝච්ච රේඛාව දක්වා විහිදෙන ප්‍රදේශය ..................නම් වේ.
2. වෙරළ දඹ ලක්ෂණයක් .............................ප්‍රදේශයේ දක්නට ලැබේ.
3. ශ්‍රී ලංකාවේ ගංගා වලින් 80% ..................................හරහා ගලා බසී .
4. වෙරළබඩ කලාපය තුළ සිදුකරන මානුෂ ක්‍රියාකාරකමක් ලෙසට .................... දැක්විය හැක.
5. ශ්‍රී ලංකාවේ ජන ඝනත්වය අඩුම දිස්ත්‍රික්කය .........................වේ.

**(මුලතිව් , වෙරළබඩ තැනිතලාව , වියළි කලාපය , කොහු කර්මාන්තය , ත්‍රිකුණාමලය)**

**ක්‍රියාකාරකම 02**
පහත දැක්වෙන කියමන් නිවැරදි නම් **නි** වටාද වැරදි නම් වැ වටාද රවුමක් අඳින්න.

1. අසනි වැසි සවස් කල වැසි නමින් සංවහන වර්ෂාව හැඳින්වෙයි
2. කන්නෙලිය දෙදියගල පහත රට තෙත් කලාපීය පහතරට තෙත්කලාපීය වනාන්තරයි
3. තෙත් කලාපය තුළ අධික ජන ඝනත්වයක් පවතී
4. වැව් ගම්මාන හා ධීවර ගම්මානය ගැමි නාගරික ජනාවාස වලට උදාහරණ වේ
5. ගල් අඟුරු පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයකි

**ක්‍රියාකාරකම 03**
පහත ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු සපයන්න.

1. ශ්‍රී ලංකාවේ කඩොලාන ශාක ව්‍යාප්ත වී ඇති ප්‍රදේශ දෙකක් නම් කරන්න.

2. බස්නාහිර පළාත තුළ ජනයා ඒකරාශී වීමට බලපා ඇති හේතු දෙකක් ලියන්න.

3. උෂ්ණත්ව ව්‍යාප්තියේ වෙනස්කම් කෙරෙහි බලපාන සාධක දෙකක් ලියන්න.

4. ශ්‍රී ලංකාව තුළ වාසුලි වර්ෂාව ප්‍රබල ව ක්‍රියාත්මක වන්නේ කුමන මාස වල ද?

5. මානුෂ ක්‍රියාකාරකම් හේතුවෙන් ගොඩබිම පරිසර පද්ධතියට ඇති වී තිබෙන බලපෑම දෙකක් ලියන්න.